# 2557 - මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2013

3 ශ්‍රේණිය (08) සමාජ විද්‍යාව පැ තුනයි

* I කොටසේ ප්‍රශ්න සියල්ලටත්, II කොටසින් තෝරාගත් ප්‍රශ්න **හතරකටත්** පිළිතුරු ලියන්න.

## I කොටස

### 01. කෙටි පිළිතුරු සපයන්න.

i. සමාජ විද්‍යාවේ පියා ලෙස හඳුන්වන්නේ කවු ද?

ii. සමාජ විද්‍යාව වර්ධනයෙහි පුරෝගාමී වූ පුද්ගලයින් දෙදෙනෙකු නම් කරන්න.

iii. සමාජ අධ්‍යනය සඳහා එමිල් ඩූර්කයිම් රචනා කළ ග්‍රන්ථය කුමක් ද?

iv. සමාජ විද්‍යාව මගින් අධ්‍යනය කරනු ලබන ප්‍රධාන තේමාවන් දෙක නම් කරන්න

v. සමාජ විද්‍යාව ඉගෙන ගැනීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන දෙකක් ලියන්න

vi. ශ්‍රී ලංකාවේ බහුලව දැකිය හැකි සමාජ ප්‍රශ්න දෙකක් සඳහන් කරන්න.

vii. වර්තමාන පිරිවෙන් අධ්‍යාපනයේ පුනර්ජීවනයට උරදුන් සංඝ පීතෘන් වහන්සේ නම් කරන්න.

viii. සමාජානුයෝජන කාරක දෙකක් ලියන්න.

ix. වෙසක් දිනය ජාත්‍යන්තර නිවාඩු දිනයක් කිරීමට වෙහෙස වූ ශ්‍රී ලාංකිකයා කවුද?

x. මහින්දාගමනයට පෙර ශ්‍රී ලංකාවේ පැවැති ආගම් දෙකක් නම් කරන්න.

(ලකුණු 4x10 = 40)

## 11 කොටස

02. සිංහල සංස්කෘතිය කෙරෙහි බුදු දහමින් ලද ආභාසය කෙබඳු දැයි විස්තර කරන්න.

03. සමාජ විද්‍යාවට අනුව සමාජයක් යනු කුමක් දැයි යන්න පැහැදිලි කරන්න.

04. අවිධිමත් හා විධිමත් සමාජ පාලනයන් තුලනය කරන්න.

05. සමාජ පාලනයට සිරිත් විරිත් බලපාන අයුරු විස්තර කරන්න.

06. සමාජ පාලනයෙහි භික්ෂූන් වහන්සේගේ කාර්ය භාරය කෙබඳු ද?

07. සමාජ ප්‍රශ්න විසඳීමට බුදු දහමින් ලැබෙන පිටිවහල කෙබඳු දැයි පහදන්න.

(ලකුණු 15x4 = 60)